සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

**නම : ...............................................** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය : පැය 02 යි.**

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01-07 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නූතන සිංහල අක්ෂර මාලාවෙහි ඇති ව්‍යඤ්ජන අක්ෂර ගණන,
1. 18කි. 2. 40කි. 3. 60කි. 4. 42කි.

(2) සඤ්ඤක අක්ෂරයක් සහිත පිළිතුර තෝරන්න.
1. ළමයා 2. අභය 3. සුළඟ 4. නුවණ

(3) ප්‍රථම පුරුෂ ඒකවචන වර්තනමාන කාල ක්‍රියා පදය තෝරන්න.
1. කරති. 2. කළාය. 3. කළේය. 4. කරයි.

(4) 'දූරියක සමඟ මවක් වෛද්‍යවරයෙකු මුණ ගැසුණාය.' යන වාක්‍යයේ උක්ත පදය කුමක් ද?
1. මවක් 2. දූරියක 3. වෛද්‍යවරයෙකු 4. සමඟ

(5) හල් කළ නොහැකි ව්‍යඤ්ජනාක්ෂරයක් වන්නේ,
1. ළ ය. 2. ණ ය. 3. ෆ ය. 4. ඟ ය.

- අංක 06 හා 07 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

(6) 1. ලේඛම් 2. වර්ගඵලය 3. දර්ශණය 4. මර්ධනය

(7) 1. සාර්ථක 2. දක්සිණ 3. ආරම්බය 4. සංකීර්න

- අංක 08 හා 09 තෙක් ප්‍රශ්නවල දී ඇති පදයට සමානාර්ථ පදයක් තිත් ඉරි මත ලියන්න.

(8) පණිදා .........................................................

(9) දිනමිණ .........................................................

- අංක 10 හා 11 ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධාර්ථ පදය තිත් ඉරි මත ලියන්න.

(10) බාහිර .................................................................

(11) දුදන .................................................................

(12) පහත වාක්‍යයේ සඳහන් නාම විශේෂණ පද දෙකක් උපුටා තිත් ඉරි මත ලියන්න.
කරුණාවන්ත ගැහැනිය පොඩි දරුවාට මල් ගවුමක් දෙයි.

.............................................................................................................................................................................

(13) පහත වාක්‍යයේ සඳහන් ක්‍රියා විශේෂණ පද දෙකක් උපුටා තිත් ඉරිමත ලියන්න.
වේගයෙන් දුවන ශිෂ්‍යයාට නරඹන්නෝ ප්‍රීතියෙන් අත්පුඩි ගැසූහ.

.............................................................................................................................................................................

l අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා තිත් ඉරිමත ලියන්න.

(14) .......................................................... වැසි වැටෙන තෙක් බලා සිටියෝ ය.

(15) වේගයෙන් වනාන්තරයට වැදුණු ................................................................. ගස් අතර සැඟ වී ගියේ ය.

(16) ..................................................... ත්‍යාගය ලබා ගත්තේ ය.
(ගවයා/ කොටි/ ගොවියෝ/ ජයග්‍රහකයෝ/ ජයග්‍රහකයෙක්)

l අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පද වරහන් තුළින් තෝරා ලියන්න.

(17) ගඟ රට සරුසාර කරමින් මුහුදට ගලා ............................................................... (බසියි/ බසිති)

(18) වෛද්‍යවරියක් රෝගියා පරීක්ෂා .......................................................... (කළේය/ කළාය)

(19) තොපි උදෑසනම ගමට ................................................ (යහු/ යහි)

(20) පහත වාක්‍ය නිවැරදිව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉරිමත ලියන්න.
අම්මේඅනික්පාරමමත්බෝට්ටුවෙන්යනවායිශරත්කෑගැසුවේය.

.............................................................................................................................................................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

l ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'වටු කිරිල්ලී සහ තවත් කතා' නම් ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) ළමුන් සඳහා කුමාරතුංග මුනිදාස මහතා අතින් ලියැවුණු ගද්‍ය කෘති දෙකක නම් ලියන්න.

(iii) පන්සිය පනස් ජාතක පොතේ ඇතුළත් කතා ගණන කීයද?

(iv) ''තොප මහ වාසලට කිසි වරදක් නොකෙළෙහි ය.''

ඉහත පාඨය උපුටා ගත් පාඩමේ නම ලියන්න.

(v) උදා දිනිඳු කර හරණේ
විදා අඳුරු දිසි කිරණේ
යොදා දෙපස රන් තොරණේ
සදා මෙලෙස පුර දෙරණේ

ඉහත පද්‍ය අඩංගු මුල් කෘතිය කුමක් ද?

(vi) පිල්ලමක් නිරූපනය නොකරන ස්වර අක්ෂර ලියන්න.

(vii) 'භෞතික' යන වචනයේ ස්වර ව්‍යඤ්ජන වෙන් කර දක්වන්න.

(viii) පහත නාම පදවල අනුක්ත පදය ලියන්න.

(අ) සංඝමිත්‍රයෝ - ........................................................ (ආ) රජ - ................................................

(ix) 'රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව' යන්න කෙටි කර ලියන්න.

(x) 'මම පොත කියවමි' වාක්‍යය බහු වචනයට හරවා ලියන්න.

(ලකුණු 1 x 10 = 10)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) ස්වභාවික පරිසරය හා බැඳුණු ආදි වාසීහු

(ii) ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය

(iii) නීරෝගීතාවය සඳහා ආහාරවල වැදගත්කම

(iv) ගැල්කරුවෙකුගේ ජීවිතය

(v) සාරධර්ම ආරක්ෂා කරමු. (ලකුණු 20)

(03) පහත සඳහන් අවස්ථා දෙකින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

(අ) ඔබ පාසලේ පැවැත්වෙන වාර්ෂික විද්‍යා ප්‍රදර්ශනය පිළිබඳ දැනුම්වත් කරමින් මෙවර පවත්වන ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ඉල්ලමින් දුර බැහැර සිටින ඔබේ මාමාට යවන ලිපිය ලියන්න.

නැතහොත්

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය ඉතා උසස් ලෙස සමත් වූ ඔබේ වැඩිමල් සොයුරියට සුබ පැතීම සඳහා සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න. (ලකුණු 10)

(04) පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

තැන්න මතින් ගලා බසින කුඩා දිය කඩිති හෝර්ටන් තැන්නේ මනහර දසුනකි. දිය කඩිති ගලා බසින ඉවුරු දෙපස බහුල ලෙස දිස්වන්නේ බෝවිටියා විශේෂය, දිය සීරා ඇති තැන්වලින් පැන නැගුණු කුඩලු වර්ග, බිගෝනියා හා කෝලියාස් වර්ග ඉතා පැහැබර ය. නන් පැහැගත් පුංචි කුඩලු පුෂ්පය නෙත් සිත් පැහැර ගනියි. තැන්න පුරා දුවන පනින කුඩා දිය පහරවල කෙකටිය වර්ග දිය පාසි වර්ග, බෙරලිය සහ මීවන විශේෂ රාශියක් ම දැක ගත හැකි ය.

(i) මෙම ඡේදයෙන් කියවෙන්නේ කුමන ස්ථානයක් පිළිබඳව ද?

(ii) බෝවිටියා පඳුරු බහුල ලෙස දක්නට ලැබෙන්නේ කොහෙ ද?

(iii) පැහැබර ලෙස දිස්වන ශාක වර්ග දෙකක නම් ලියන්න.

(iv) කෙකටිය, දියපාසි වැනි ශාක වර්ග දක්නට ලැබෙන්නේ කොහි ද?

(v) පහත වචනවලට සමාන වචන ඡේදයෙන් තෝරා ලියන්න.

(අ) සුන්දර

(ආ) නොයෙක් පාට (ලකුණු 2 x 5 = 10)

(05) (i) පහත අතීතකාල වාක්‍යය අනතීත කාලයට හරවා ලියන්න.

(අ) ගෙවිලිය ඇඹුල රැගෙන කුඹුරට ගියා ය.

(ආ) නුඹ හොඳින් පාඩම් කළෙහි.

(ඇ) විදුහල්පතිතුමා උදෑසන රැස්වීමට පැමිණියේ ය.

(ඈ) ඇත්තු වනය තුළට ගමන් කළහ.

(ඉ) අපි පාසල් වත්ත පිරිසිදු කළෙමු. (ලකුණු 1 x 5 = 5)

(ii) පහත උද්ධෘත කවුරුන් විසින් කාහට ප්‍රකාශ කරන ලද දැයි ලියන්න.

(අ) අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්ට ඇත්නම්

(ආ) දූන් කොහොම ද? ඔබේ සුදානම?

(ඇ) 'මෙය රැගෙන, මට යන්ට ඉඩ දුන මැනව' (ලකුණු 1 x 3 = 3)

(iii) පහත කවි සම්පූර්ණ කරන්න.

(අ) ඉරු ගිලෙන දවසේ
ගහණ ද පොහෝ දවසේ
සඳ සිකුරු දවසේ
..........................................................................................

(ආ) සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
.......................................................................................... (ලකුණු 1 x 2 = 2)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

### සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

## I කොටස

01. 4
02. 3
03. 4
04. 1
05. 4
06. 2
07. 1
08. නාගයා, නයා
09. හිරු, ඉර, සූර්යයා, දිවාකර....
10. අභ්‍යන්තර
11. සුදන
12. කරුණාවන්ත, පොඩි, මල්
13. වේගයෙන්, ප්‍රීතියෙන්
14. ගොවියෝ
15. ගවයා
16. ජයග්‍රහකයෙක්
17. බසියි
18. කළාය
19. යහු
20. ''අම්මේ, අනික් පාර මමත් බෝට්ටුවෙන් යනවා''යි ශරත් කෑ ගැසුවේ ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) ඒ. පී. ගුණරත්න මහතා
(ii) හත්පණ, හීන්සැරය, මඟුල් කෑම
(iii) 547කි.
(iv) රාසිංදෙයියන්ට බැණ වැදුණු මුරකරුවා
(v) ගුත්තිල කාව්‍යය
(vi) අ
(vii) හ් + ඖ + ත් + ඉ + ක් + අ
(viii) (අ) සංඝමිත්‍රයන් (ආ) රජ
(ix) ර. මු. නී. ස
(x) අපි පොත් කියවමු. (ලකුණු 1 x 10 = 10යි.)

02. මාතෘකාවට අදාළ කරුණු 6
සංවිධානාත්මක බව, ස්වියත්වය 10
ශිල්පීය දක්ෂතා 4
මුළු ලකුණු 20 යි.
(උචිත පරිදි ලකුණු ප්‍රදානය කරන්න.)

03. ආකෘතිය 3
අඩංගු කරුණු 5
ශිල්පීය දක්ෂතා 2
මුළු ලකුණු 10යි.
(උචිත පරිදි ලකුණු ප්‍රදානය කරන්න)

04. (i) හෝර්ටන් තැන්න
(ii) ගලා බසින ඉවුරු දෙපස
(iii) කුඩලු වර්ග, බිගෝනියා, කොලියාස්
(iv) කුඩා දිය පහරවල්වල
(v) (අ) මනහර (ආ) නන් පැහැ (ලකුණු 2 x 5 = 10යි.)

05. (i) (අ) ගෙවිලිය ඇඹුල රැගෙන කුඹුරට යයි./ යන්නීය.
(ආ) නුඹ හොඳින් පාඩම් කරහි.
(ඇ) විදුහල්පතිතුමා උදෑසන රැස්වීමට පැමිණෙයි/ පැමිණෙන්නේ ය.
(ඈ) ඇත්තු වනය තුළට ගමන් කරති./ කරන්නෝ ය.
(ඉ) අපි පාසල්වත්ත පිරිසිදු කරමු/ කරන්නෙමු. (ලකුණු 1 x 5 = 5)

(ii) (අ) කයිරා විසින් පොරමොලාට
(ආ) නිවේදක විසින් ශිෂ්‍යයාට
(ඇ) I මඟී වෙස් ගෙන සිටි රජතුමා විසින් හවඩියාට/ මුරකරුට
I රාජසිංහ රජතුමා විසින් මුරපොළ මුරකරුට
(අදාළ පිළිතුර සලකා ලකුණු පිරිනමන්න.) (ලකුණු 1 x 3 = 3)

(iii) (අ) ගොමින් පිරිබඩ ගනුව නිවසේ
(ආ) තබවා පුන්කුඹු විසිතුරු (ලකුණු 1 x 2 = 2)